# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.05.31 |

## කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2023 මැයි මාසයේ දී තවදුරටත් තියුණු පහළ යෑමක් පෙන්නුම් කළේය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 අප්‍රේල් මාසයේ වාර්තා වූ සියයට 35.3හි සිට 2023 මැයි මාසයේ දී සියයට 25.2 දක්වා පහළ යෑමක් වාර්තා කළේය. මතුපිට උද්ධමනයේ මෙම පහළ යෑම, 2023 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කරන ලද උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවට බොහෝ දුරට අනුකූල වේ.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2023 අප්‍රේල් | 2023 මැයි |
|---|---|---|
| දර්ශක අගය | 192.3 | 192.3 |
| මාසික වෙනස (%) | -1.4 | 0.0 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 35.3 | 25.2 |

ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2023 අප්‍රේල් මාසයේ පැවති සියයට 30.6හි සිට 2023 මැයි මාසයේ දී සියයට 21.5 දක්වා පහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2023 අප්‍රේල් මාසයේ පැවති සියයට 37.6හි සිට 2023 මැයි මාසයේ දී සියයට 27.0 දක්වා පහළ ගියේය. 2023 මැයි මාසයේ දී කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස, සියයට -0.02ක් ලෙස වාර්තා විය. මෙම සුළු මාසික වෙනස සඳහා ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි වාර්තා වූ සියයට -0.56ක මිල පහළ යෑම, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි දක්නට ලැබුණු සියයට 0.53ක මිල වැඩිවීම මගින් තුලනය වීම හේතු විය. ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2023 අප්‍රේල් මාසයේ පැවති සියයට 27.8හි සිට 2023 මැයි මාසයේ දී සියයට 20.3 දක්වා පහළ ගියේය.

**කො.පා.මි.ද. (2021=100) මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




දැනට පවතින තොරතුරු අනුව, උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාවය අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, මින් පෙර පැවති පුරෝකථනයන්ට වඩා වැඩි වේගයකින් උද්ධමනය අඩු වී 2023 වසරේ තුන්වන කාර්තුව වන විට තනි අගයක මට්ටමට ළඟා වනු ඇත. මෙලෙස උද්ධමනය පහළ යෑම කෙරෙහි දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල පසු බලපෑම, ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම, ඉන්ධන සහ ගෑස් මිල අඩු වීම, ආහාර මිල ගණන් යථා තත්ත්වයට පත්වීම, මෙන්ම හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම් ද සහාය වනු ඇත.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන(අ)**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,(ආ) කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %**




උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ භූ-දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිත බව සාමාන්‍ය කාලයන්ට වඩා බෙහෙවින් ඉහළ වේ. විශේෂයෙන්ම, සැපයුම් තත්ත්වයන් ශීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත් වීම, අපේක්ෂිත මට්ටම්වලටත් වඩා වැඩි වශයෙන් ගෝලීය වෙළඳ භාණ්ඩ මිල පහළ යෑමේ හැකියාව, ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම හේතුවෙන් ආනයනික භාණ්ඩවල උද්ධමනය පහළ යෑම, සහ අපේක්ෂිත විදුලි ගාස්තු පහල යෑම යනාදී කරුණු හේතුවෙන් අපේක්ෂිත උද්ධමනය පහළ යෑමේ අවිනිශ්චිතතා ඇති විය හැකිය. කෙසේ වෙතත්, අපේක්ෂිත ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ ඇතිවිය හැකි ඉල්ලුම් පීඩන සහ ආනයන සීමා ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමට ඇති හැකියාව හේතුවෙන් අපේක්ෂිත පුරෝකථනයන්ට වඩා උද්ධමනය ඉහළ යෑමේ අවිනිශ්චිතතා ඇති විය හැකිය.

***මූලය**: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු නිකුත් කිරීමත් සමගම මහ බැංකුව එහි මැදි කාලීන ආර්ථික පුරෝකථන කාර්තුමය පදනමින් සංශෝධනය කරයි. මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහන මගින් දක්වා ඇති පුරෝකථන මගින් පවතින දත්ත සහ 2023 වසරේ අප්‍රේල් මාසයේ පුරෝකථන වාරයේ දී සිදු කරන ලද උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ.

(ආ) 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වූ දත්ත කො.පා.මි.ද. (2013=100) මත පදනම් වන අතර 2023 වසරේ පළමු කාර්තුව සඳහා වූ දත්ත කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2022 | ජූනි | 171.7 | 154.7 | 11.8 | 8.8 | - | - |
| | ජූලි | 178.9 | 160.9 | 4.2 | 4.0 | - | - |
| | අගෝස්තු | 182.8 | 163.6 | 2.2 | 1.7 | - | - |
| | සැප්තැම්බර් | 189.3 | 168.8 | 3.6 | 3.2 | - | - |
| | ඔක්තෝබර් | 188.5 | 170.4 | -0.4 | 0.9 | - | - |
| | නොවැම්බර් | 187.1 | 171.1 | -0.7 | 0.4 | - | - |
| | දෙසැම්බර් | 187.6 | 171.5 | 0.3 | 0.2 | - | - |
| 2023 | ජනවාරි | 188.6 | 172.4 | 0.5 | 0.5 | 51.7 | 45.6 |
| | පෙබරවාරි | 189.5 | 172.3 | 0.5 | -0.1 | 50.6 | 43.6 |
| | මාර්තු | 195.0 | 171.9 | 2.9 | -0.2 | 50.3 | 39.1 |
| | අප්‍රේල් | 192.3 | 171.5 | -1.4 | -0.2 | 35.3 | 27.8 |
| | මැයි | 192.3 | 171.0 | 0.0 | -0.3 | 25.2 | 20.3 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව